PEOPLE'S BANK

ප්‍රධාන කළමනාකාර
පුද්ගල කේන්ද්‍රීය බැංකුකටයුතු දෙපාර්තමේන්තුව
මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය
අංක 75, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02.

දුරකථන අංක 0112481684
ෆැක්ස් 0112478150
Email : cihalakorala@peoplesbank.lk

---

අපේ යොමුව :ප්‍රකළ/ඒඑස්/සහ /D/446 2021.07.19

SLIATE
06 AUG 2021
Director General

මහාචාර්ය කේ. එල් ජයරත්න මහතා
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
නො.320 " ජනවතු පියස"
ටී.බී.ජයා මාවත
කොළඹ 10

ප්‍රිය මහත්මයාණෙනි,

**අධ්‍යාපන අමාත්‍යාංශය ( උසස් අධ්‍යාපන අංශය) මගින් ක්‍රියාත්මක කරන ලැප්ටොප් පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ලබා දෙන සහනදායි පොලී ණය පහසුකමලබාගැනීම සම්බන්ධවයි.**

ඔබතුමා විසින් අපගේ ගරු සභාපතිතුමන් ආමන්ත්‍රිත 2021.07.12 දිනැති ලිපිය හා බැදේ.

රටේ පවතින කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ සිසු දරු දැරියන්ගේ අධ්‍යාපන කටයුතු දුරස්ථ අධ්‍යාපන ක්‍රමයට පවත්වාගෙන යෑමට සිදු වී ඇති අතර සිසුන්ට ඒ සඳහා සම්බන්ධ වීමට පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ඉතා සහනදායි පොලී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් ලබා දීමට අප බැංකුව මේ වන විටත් කටයුතු කරමින් සිටී. ඒ අනුව ඔබ ආයතනයේ අධ්‍යාපනය ලබන සිසු දරු දැරියන්ට අප බැංකුවේ ක්‍රියාත්මක වන විස්ඩම් (People`s Wisdom) ණය යෝජනා ක්‍රමය යටතේ පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මූල්‍ය පහසුකමක් ලබා ගත හැකි බව කාරුණිකව දන්වා සිටිමු. . ඒ පිළිබඳ සාරාංශ ගත කරන ලද පහත සඳහන් තොරතුරු ඔබ දෙපාර්තමේන්තුවේ අවධානය පිණිස පහතින් දක්වමු.

- දැනට ස්ථිර රැකියා වල නිරත වන වන අයදුම්කරුවන් හට මෙන්ම රැකියා විරහිත අයදුම්කරුවන් සඳහා ද මෙම යෝජනා ක්‍රමය යටතේ පහසුකම් සලකා බලනු ලැබේ.
- රැකියා විරහිත අයදුම්කරුවන්, ණය ආපසු ගෙවීමේ හැකියාවකින් යුක්ත බද්ධ අයදුම්කරුවෙකු සමඟ බද්ධව අයදුම් කල යුතුය.
- පරිගණක යන්ත්‍රය මිලදී ගැනීමට අපේක්ෂිත ආයතනයේ පිළිගත් මිල කියුමක් (Quotation) ඉදිරිපත් කලයුතු අතර ඒ සඳහා වූ ගෙවීම අදාල ආයතනය වෙත සෘජු ගෙවීමක් ලෙස සිදු කරනු ලබයි.
- පරිගණකයේ සම්පූර්ණ වටිනාකම සඳහාම ණය පහසුකම් සලකා බැලිය හැකි වේ.
- පොලී අනුපාතයන් පහත පරිදි වේ.

| ආපසු ගෙවීමේ කාලය | පොලී අනුපාතය |
|---|---|
| මාස 24 දක්වා | 8.5% |
| මාස 36 දක්වා | 8.75% |
| මාස 48 දක්වා | 9.00% |
| මාස 60 දක්වා | 9.25% |

- අවශ්‍යතාවය මත උපරිම මාස 12 ක සහන කාලයක් සලකා බැලිය හැකිය.

- සුරැකුම් : ස්ථිර වැටුප් ලබන රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සේවයේ නියුක්ත අයෙකුගේ පුද්ගල ඇපය.

- අපගේ ඕනෑම මහජන බැංකු ශාකාවකින් ඉහත පහසුකම ලබාගත හැකි අතර මේ පිළිබඳව ඔබ ආයතනයේ සිසු දරු දැරියන් දැනුවත් කරනු ඇතැයි අපේක්ෂා කරමු.

මෙයට - විශ්වාසී,

චමින්ද ඉහළකෝරාල
ප්‍රධාන කළමනාකාර
(පුද්ගල කේන්ද්‍රීය බැංකු කටයුතු)